| රාජකීය විද්‍යාලය - කොළඹ 07<br>පළමු වාර පරීක්ෂණය - 2018 | | |
|---|---|---|
| ගණිතය | 09 ශ්‍රේණිය | කාලය පැය 1 ½ යි |
| නම : | අංකය : | පංතිය : |

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට සපයා දී ඇති ඉඩ ප්‍රමාණයේ පමණක් පිළිතුරු සපයන්න. (ලකුණු 2 x 25 = 50)

(1) 2.5 x 100 අගය සොයන්න.

(2) -5, -10, -15, -20, ................ සංඛ්‍යා රටාවේ ඊළඟ පදය ලියා දක්වන්න.

(3) 50% යන්න භාගයක් ලෙස දක්වන්න.

(4) $10_{දහය}$ සංඛ්‍යාව ද්විමය සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(5) දී ඇති සෘජුකෝණික ත්‍රිකෝණයේ $a^0$ හි අගය සොයන්න.




(6) $^2/_3$ න් $^3/_5$ ක් කොපමණද?

(7) සුළු කරන්න, $(x+3)(x-1)$

(8) AOC සරල රේඛාවක් නම් $x^0$ හි අගය සොයන්න.




(9) රුපියල් 2000කට ගත් භාණ්ඩයක් විකිණීමේදී රුපියල් 200ක ලාභයක් ලැබේ නම් ලාභ ප්‍රතිශතය සොයන්න.

(10) $x = 2$ වන විට $x^3$ හි අගය සොයන්න.

(11). වරහන් ඉවත්කර සුළු කරන්න.

$-2(a-3)+3a$

(12) සමාන කේන්ද්‍රික ඛණ්ඩ පහකට බෙදා වෘත්තයකින් කේන්ද්‍රික ඛණ්ඩ තුනක් අඳුරු කර ඇත. අඳුරු කර ඇත්තේ මුළු වෘත්තයෙන් කවර ප්‍රතිශතයක්ද?



(13) (-3) – (+3) හි අගය සොයන්න.

(14) $P^0$ හි අගය සොයන්න.




(15) $2a^2+4ab$ සාධක වෙන් කරන්න.

(16) රූපයේ,

$P\hat{O}R = Q\hat{O}S$ වේ. ප්‍රත්‍යක්ෂ භාවිතයෙන් $P\hat{O}Q = R\hat{O}S$ බව පෙන්වන්න.




(17) $^2/_3\, y = 4$ නම් y හි අගය සොයන්න.

(18) 1, 4, 9, 16, 25, .......... යන සංඛ්‍යා රටාවේ 10 වන පදය කීයද?

(19) $n = -^2/_3$ ආදේශයෙන් - 6n හි අගය සොයන්න.

(20) $1 - x^2$ හි සාධක වෙන් කරන්න.

(21) සුළු කරන්න, $1011_{දහය}$ - $110_{දහය}$

(22) භාණ්ඩයක් රුපියල් 50 000කට විකිණීමේදී රුපියල් 1 500 ක් කොමිස් වශයෙන් ලැබේ නම්, කොමිස් අය කළ ප්‍රතිශතය සොයන්න.

(23) පැත්තක දිග 5 cm වූ සමචතුරස්‍රයකින් පැත්තක දිග 2 cm වූ සමචතුරස්‍ර කොටසක් ඉවත් වන සේ අඳුරු කර ඇති රූපයක් දී ඇත. අඳුරු කළ කොටසේ වර්ගඵලය වර්ග දෙකක අන්තරය සඳහා වූ සාධක දැනුම භාවිතයෙන් සොයන්න.




(24) වට්ටම් ප්‍රතිශතය 5% ක් ලෙස දී ඇතිවිට රුපියල් 3 000 කට ලකුණු කළ භාණ්ඩයකට ලැබෙන වට්ටම සොයන්න.

(25) දී ඇති රූපයේ ඇති සියළුම ත්‍රිකෝණ ගණන කොපමණද?



## II කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ලකුණු 10 x 5 = 50)

(1) n වන පදය $T_n$ වන සංඛ්‍යා රටාවක පොදු පදය $T_n = 3n + 1$ වේ.

(i) පළමු පද තුන $T_1$, $T_2$ සහ $T_3$ ලියා දක්වන්න. (ල. 03)

(ii) දහවන පදය $T_{10}$ සොයන්න. (ල. 02)

(iii) 91 වන්නේ කීවන පදයද ? (ල. 02)

(iv) මෙම සංඛ්‍යා රටාවේ 30 යන පදයක් තිබිය නොහැකි බව පෙන්වන්න. (ල. 03)

---

(2) (i) සුළු කරන්න. (ල. 03)

$$2\frac{3}{5} \div \left(\frac{2}{3} + 1\frac{1}{2}\right)$$

(ii) ගමනකින් $\frac{3}{5}$ ක් බසයකින් ද, ඉතිරියෙන් $\frac{1}{2}$ ක් ත්‍රීරෝද රථයෙන් ද ගමන් කළ සමන් ඉතිරිය පයින් ද ගොස් ගමන නිමා කරන ලදී. පයින් ගිය දුර මුළු දුරින් කොපමණ කොටසක් ද? (ල. 03)

(iii) $30_{\text{දහය}}$ සංඛ්‍යාව ද්වීමය සංඛ්‍යාවක් ලෙස දක්වන්න. (ල. 02)

(iv) සුළු කරන්න. (ල. 02)

$$101_{\text{දෙක}} + 110_{\text{දෙක}} - 110_{\text{දෙක}}$$

- - www.mathspapers.info - -

(3) (i) $\frac{2}{5}$ ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ල. 02)

(ii) රුපියල් 2 000කට ගත් භාණ්ඩයක් රුපියල් 2 400කට විකිණීමේදී සිදුවන ලාභ ප්‍රතිශතය ගණනය කරන්න. (ල. 03)

(iii) රුපියල් 3 600කට මිල ලකුණු කළ භාණ්ඩයකට 5% ක වට්ටමක් ලබා දේ. එහි විකුණුම් මිල ගණනය කරන්න. (ල. 03)

(iv) 3% ක කොමිස් ප්‍රතිශතයක් ලබා දෙන අවස්ථාවක කොමිස් මුදල් වශයෙන් රුපියල් 1500 ක් ලැබීමට කොපමණ මුදලකට විකිණිය යුතුවේද? (ල. 02)

---

(4) (i) සහ (ii) කොටස්වල සාධක වෙන් කරන්න.

(i) $x^2 - 25$ (ල. 02)

(ii) $P^2 - 10P + 21$ (ල. 03)

(iii) වරහන් ඉවත් කර සුළු කරන්න.

$a(5a + 3) - 3a(a + 1)$ (ල. 02)

(iv) $a = \left(-\frac{1}{2}\right)$ ද, $b = \frac{2}{3}$ ද ආදේශයෙන් පහත ප්‍රකාශනයේ අගය සොයන්න. (ල. 03)

$4a + 6b$

---

(5) (i) $a^0$ සහ $2a^0$ කෝණවල අගය සොයන්න. (ල. 04)




(ii) $p^0$ සහ $q^0$ කෝණවල අගය සොයන්න. (ල. 04)




(iii) පහත රූපයේ $A\hat{O}B = C\hat{O}D$ වේ. ප්‍රත්‍යක්ෂ භාවිතයෙන් $A\hat{O}C = B\hat{O}D$ බව පෙන්වන්න (ල. 02)






ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න